Prepared by- පී.ර්.එම්.ආර්.ආර්.ආර්.ඒකනායක

2.8.1 :- නාට්‍යට අදාල අංග රචනය

අංග රචනය යනු :-

නාට්‍යක චරිතවලට අදාලව නළු නිලියන්ගේ මුහුණ,ශරීරයේ අංග තාවකාලිකව වෙනස් කිරීම . වෙස්ගැන්වීම ,ලෙස සරලව දැක්විය හැක.එසේම ආහාර්ය අභිනයට අයත් අනුශාංගික අංගයකි.මෙමගින් නළුවාගේ සාත්වික අභිනයට සාර්තක කර ගැනීමට සෘජු බලපෑමක් ඇති කරයි.

අංග රචනය ප්‍රධාන කොටස් 2කට බෙදා වෙන්කල හැක

1. සරල අංග රචනය

2. චරිතාංග අංග රචනය

සරල අංග රචනය

යම් පුද්ගලයෙකුගේ ස්වරූපය වැඩි වෙනසකට බඳුන්නොකොට ඒ ආකාරයෙන්ම හැඩ ගැන්වීමයි. එනම් නළුවාගේ මුහුණේ පිහිටා ඇති ලක්ෂණ තීව්‍ර කිරීම පමණි. සමට ගැලපෙන පදනම් ආලේපනයක් භාවිතා කරමින් මුදුණේ ඇති අක්‍රමවත් කැලල් ,දුර්වර්ණ වූ ස්ථාන සකසා පැතලි ස්වභාවයක් ගෙන නාසයේ උඩ කොටස,කම්මුල්,ඇස උඩ සම ,ඇහි බැම,අහි පිහාටු,දෙතොල් අංග රචන ද්‍රව්‍ය භාවිතා කරමින් තීව්‍ර කිරීමයි.මෙහිදී මුහුණට ඉතා පියකරු පෙනුමක් ලැබේ. ( මනාලියන් හැඩ ගැන්වීමේ දී මෙම ක්‍රියාවලිය සිදු කරයි )

චරිතාංග අංගරචනය

මෙහිදී චරිතයට අදාලව නළුවාගේ මුහුණ හිසකෙස්,ශරීර අංග තාවකාලිකව වෙනස් කම්වලට භාජනය කරයි.නළුවාගේ වයසට වඩා වැඩි වයසක ස්වරූපයක් දැක්වීම හෝ තරුණ කිරීම,විරූපී කිරීම,රෝග ලක්ෂණ පෙන්වීම,අභ්‍යන්තර මනෝභාවයන් පෙන්වීමට හැකියාව ඇත.

- අංග රචනා කිරීමේදී මුහුණ මූලික වශයෙන් කොටස් 6කට බෙදෙයි.

1.නළල 2.ඇස් 3.කට 4.කම්මුල් 5.නිකට 6.නාසය

- අංග රචනා කිරීමේදී මිනිස් මුහුණේ මූලික ආකෘති 7 කි.

1.ඕවල් හැඩය 2.ගෝලාකාර හැඩය 3.සමචතුරස්‍රාකාර හැඩය 4.දීර්ඝ චතුරස්‍ර හැඩය 5.ත්‍රිකෝණ හැඩය 6.පෙරළුණු ත්‍රිකෝණ හැඩය 7.දියමන්ති හැඩය

අංග රචනා ද්‍රව්‍ය

1. පදනම් ආලේපන ( සමේ වර්ණය අනුව අංක කර ඇත 26,27,28,29,30 හා රතු,සුදු,කළු,කහ,නිල්.ඊජිප්තියානු දුඹුරු ආදී වශයෙන් )

2. පේස් පේන්ට් ( ලයිනින් කලර්,ග්‍රීස් පේනට් ) නිල්,රතු,කළු,දුඹුරු,සුදු,කොළ,තැඹිලි,රෝස, ආදී වශයෙන්

3. අයි ලයිනර්

4. බ්ලෂර්

5. ස්ප්‍රිට් ගම්

6. ක්‍රේප් හෙයාර් (රැවුල් සැකසීමට ගන්නා කෘතිම කෙදි වර්ග ) කළු,සුදු,සුදු මිශ්‍ර කළු,තඹ ආදී වශයෙන් වර්ණ ඇත.

7. පැන්සල් හා පින්සල් වර්ග

8. ලිප්ස්ටික්

9. සකසන ලද කෘතිම කොණ්ඩා සහ රැවුල් වර්ග

10. දත් ආලේපන ( ටූත් එනමල් )

11. ස්පොන්ච් වර්ග

12. නෝස් පොටි ( ශරීයේ විවිධ හැඩතල මතු කරගැනීමට )

13. පවුඩර්

14. රිමුවින් ක්‍රීම් (බේබි ඔයිල් )

15. ටිෂූ කඩදාසි ( ටොයිලට් පේපර් රෝල් )

අංග රචනයා ශිල්පියා අංග රචනයේදී සැලකිලිමත් විය යුතු කරුණු

1.මෙහිදී අංග රචනා ශිල්පියා අංග රචනය පිළිබඳ මනාදැනුමක් තිබිය යුතු අතර අංග රචනය කිරීමට පෙර නාට්‍ය ශෛලිය පිළිබඳ අවබෝධයක් තිබිය යුතුය. අධ්‍යක්ෂක වරයා සමග සාකච්ඡා කිරීම අත්‍යාවශ්‍ය කාරණයකි. ආලෝකකරණ ශිල්පීන්,ඇඳුම් නිර්මාණ ශිල්පීන් සමගද වර්ණ පිළිබඳ සාකච්ඡා කලයුතුය.වර්ණ හා රේඛා,උපකරණ හැසරවීම පිළිබඳ අවබෝධයක් තිබීම.

2.අංග රචනා සිදු කිරීමට පෙර අංග රචනා කිරීමට සුදුසු ස්ථානයක් තෝරා ගැනීම.

3.අංගරචනාවට අවශ්‍ය භාණ්ඩ පිළිවෙලකට අසුරා ගැනීම.

4.ශිල්පියාගේ පිරිසිදු කම ඉතා වැදගත් කරුණකි. ( මුඛ ආවරණ පැලදීම ,දෑත් පිරිසිදු කිරීම, නළුවාගෙන් නළුවාට ස්පොච් මාරු කිරිම හෝ පිරිසිදු කරගැනීම )

5. අංග රචනය කිරීමට පෙර හා සිදු කරන අවස්ථාවේ දුම් පානය මත්පැන් පානය නොකල යුතුය.

6.කල්ඉකුත් වූ ආලේපන භාවිතා නොකිරීම.

7.ආලේපන මගින් නළුවාට සිදු විය හැකි අසාත්මික තා පිළිබඳ සැලකිලිමත්වීම.

8.නාට්‍ය ආරම්භ වීමට පෙර අංග රචනා සිදුකොට අවසන් කර තිබීම.

9.නාට්‍ය රඟ දැක්වීමෙන් පසු සිදු කරන ලද අංග රචනා ඉවත් කරීමට නළුවාට සහය වීම.

10.අංග රචනා ඉවත් කිරීමෙන් පසු අංග රචනා සිදු කරන ලද ස්ථානය පිරිසිදු කිරීම .ඉවත දමන ලද ටිෂූ කඩදාසි,රුවුල් කොටස් නිසි ලෙස බැහැර කිරීම.

අංග රචනා සිදු කිරීමේදී නළු නිලියන් සැලකිලිමත් විය යුතු කරුණු.

1.අංග රචනයට භාජනය වීමට පෙර පිරිසිදු වීම ,තම අවස්ථාව එළඹෙන තෙක් ඉවසිලි වන්තව සිටීම

2.හිසෙන් පළඳින ඇඳුම් ආයිත්තම් පැළඳ සිටීම.

3.අංග රචනයට භාජනය වීමට පෙර හා එම අවස්ථාවේ මත් පැන් දුම් වැටි පානය නොකිරීම.

4.අංග රචන ශිල්පියාට තම කාර්ය ඉටු කිරීමට සහය දැක්වීම.

5.නිර්මාණය කරන ලද අංග රචනය වැඩි වේලාවක් ආරක්ෂා කරගැනීම.

6.නාට්‍ය රඟ දැක්වීමෙන් අනතුරු රංග වස්ත්‍රාභරණ වලට හානි නොවනසේ අංග රචනා ඉවත්කරගැනීම.

7.ඉවත ලන ද්‍රව්‍ය නිසිලෙස බැහැර කිරීම.




පැවරුම

1.අංග රචනය යනු කුමක්ද?

2.අංග රචනය සඳහා භාවිතා කරන ද්‍රව්‍ය හා උපකරණ 5ක් ලියන්න.

3.අංග රචනය සිදු කිරීමේදී අංග රචන ශිල්පියා සැලකිලි මත්විය යුතු කරුණු 5ක් ලියන්න.